සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 8 - 2017

**නම : ............................................ සිංහල භාෂාව හා සාහිත්‍යය කාලය : පැය 2යි.**

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සහ 2 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) මල්ලී ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින් ම සමත් වූ බව ඇසූ අම්මාගේ **හිසේ මලක් පිපුණි.**
(i) හිස බර ගතියක් දැනෙන්නට විය. (ii) දැඩි සතුටක් ඇති විය.
(iii) හිසේ සැරසිල්ලක් කරන්නට විය. (iv) පුදුමයට පත් විය.

(2) තාත්තා දුටු පියසේන **ලෑල්ලට පාගා** ගියේය.
(i) ලෑල්ල පාගාගෙන ගියේ ය. (ii) ලෑල්ලට උඩින් පැන ගියේ ය.
(iii) ඉතා වේගයෙන් ගියේ ය. (iv) පරෙස්සමෙන් ගියේ ය.

- **අංක 03 සහ 04 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පමණක් අඩංගු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(3) (i) පරිසනකය, සමස්ත, මර්ධනය
(ii) පුස්ථකාලය, දෘෂ්ඨී, විශිෂ්ට
(iii) වාර්ථා, පරිවර්ථන, ලේකම්
(iv) මර්දනය, ප්‍රබල, ගැහැනිය

(4) (i) ශිෂ්ඨාචාරය, ලේකනය, ගවේශණය
(ii) වීරෝදාර, කෘත්‍රිම, භාෂාව
(iii) කලමණාකරනය, දුඹන, නිඹ්පාදන
(iv) ශිෂ්ඨ, මුග්ද, වළාකුළු

(5) නිවැරදි අකාරාදී පිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.
(i) අම්පාර, කඩවත, ගම්පහ, රත්නපුර
(ii) ගාල්ල, කහටගස්දිගිලිය, හලාවත, මහනුවර
(iii) අනුරාධපුරය, දංකොටුව, බදුල්ල, ඉඟිනිමිටිය
(iv) ආඩිගම, කුරුණෑගල, දංකොටුව, උස්වත්ත

- **අංක 6 සහ 7 ප්‍රශ්නවලට සුදුසු ආඛ්‍යාත පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

(6) මම දුකින් (මිදෙත්වා / මිදෙම්වා) .
(7) නුඹ පාසැල් (යන්නෙහු / යන්නෙහි) .

- **අංක 8 සහ 9 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ ව්‍යාකරණ රීතිය දැක්වෙන වරණය තෝරා යටින් ඉරක් අඳින්න.**

(8) <u>සුදු</u> මැණිකේ කුඹුරට ඇඹුල රැගෙන ගියා ය.
(i) නිපාත පදයකි (ii) නාම විශේෂණ පදයකි.
(iii) ක්‍රියා විශේෂණ පදයකි. (iv) පූර්ව ක්‍රියා පදයකි.

(9) ''පින් පිඬ වැනි මා මැණිය <u>කියනු</u> නොවළහා.''
   (i) විධි ක්‍රියා පදයකි.   (ii) පූර්ව ක්‍රියා පදයකි.
   (iii) මිශ්‍ර කියා පදයකි.   (iv) අසම්භාව්‍ය ක්‍රියා පදයකි.

v **අංක 10 සහ 11 ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

(10) සියදෝරිස් ලබු කැටය රැගෙන ..................................... (පැළට / පැලට) ගියේ ය.

(11) දඩයක්කාරයා දුනු හී රැගෙන ..........................................( වනයට / වණයට) ගැටුවේ ය.

v **අංක 12,13 සහ 14 ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(12) ''ළන්දකට වැදි හාවුන්ට ගෝනුන්ට මුවන්ට ඉත්තෑවුන්ට උරලෑවුන්ට අලින්ට කොටින්ට වලසුන්ට නයින්ට පොළඟුන්ට පිඹුරන්ට වෙඩි තියන්න යන්නා වාගේ හෙමින් හෙමින් මම හේනට යන කලට''
   ඉහත සඳහන් කවිපදය අයත්වන ජන කවි වර්ගය වන්නේ කුමක් ද?
   (i) පැල් කවි   (ii) පාරු කවි   (iii) ටිකා සිව්පද   (iv) කරත්ත කවි

(13) සිංහල අක්ෂර මාලාවේ ව්‍යඤ්ජනාක්ෂර ගණන කීය ද?
   (i) 5   (ii) 10   (iii) 18   (iv) 42

(14) නූතන සිංහල අක්ෂර මාලාව හඳුන්වන නමක් වන්නේ,
   (i) වර්ණ මාලාව ය.   (ii) ස්වර අක්ෂර ය.
   (iii) සිඳත් සඟරා හෝඩිය ය.   (iv) ඌෂ්මාක්ෂර ය.

(15) පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කර ලියන්න.
   (i) ගමරාලගේ ..................................................... වගේ.
   (ii) ඉත්තෑවගේ ගෙට ............................................. රිංගුවා වගේ.

(16) පහත සඳහන් පද සඳහා සමානාර්ථවත් පද දෙක බැගින් ලියන්න.
   (i) නුඹ - ..........................................., .......................................
   (ii) නුවන - ..........................................., .......................................

(17) පහත සඳහන් පද සඳහා විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
   (i) අනුලෝම - ...........................................
   (ii) උත්තම - ...........................................
   (iii) ප්‍රවීණ - ...........................................
   (iv) කැළැල් - ...........................................

(18) පහත සඳහන් බහ්වර්ථ පද සඳහා එක් පදයකට පද දෙක බැගින් ලියන්න.
   (i) දළ - ..........................................., .......................................
   (ii) වග - ..........................................., .......................................

(19) පහත සඳහන් පද සඳහා තනිපදය බැගින් ලියන්න.
   (i) එකම කාලයට අයත් - .......................................................................
   (ii) නැවත ප්‍රයෝජනය සඳහා සකස් කිරීම. - .......................................................................

(20) පහත සඳහන් තේරවිලි කවිය තෝරා ලියන්න.

පොත්ත උඩින් සුදු පාටට දිලෙන්නේ
ඇන්න විටදි සරබර හඬ නගන්නේ
ඒ ඇතුළේ පිරිපුන් සඳ දිලෙන්නේ
නැට්ට නැති ගෙඩිය තෝරා එවන්නේ

(ලකුණු 2 x 20 = 40 යි)

## II කොටස

v 1,2 හා 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

(1) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) රතු රෝස මල කෙටිකතා සංග්‍රහයේ රචකයා කවුද?
(ii) ''වැසි වසිනා අහස අපි'' ගීතයේ ගීත රචකයා කවුද?
(iii) කියවීමේ මූලික ප්‍රභේද දෙකකි. එය නම් කරන්න.
(iv) පහත සඳහන් පද දෙකෙහි අර්ථය ලියන්න.
(i) අටසාළිස්
(ii) පාදපරිචාරිකාව
(v) පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
අන්න බලාපන් අත්තක ඉඳලෝලූ
පපුව පළා ගෙන අඟනක් මඳකාලූ
.........................................................................
......................................................................... (ලකුණු 2 x 5 = 10 යි)

(2) පහත සඳහන් මාතෘකා අතුරින් **එකක්** තෝරා ගෙන වචන 150ක පමණ රචනාවක් ලියන්න.
(i) පරිසරය රැක ගනිමු.
(ii) මරු කැඳවන රිය අනතුරු.
(iii) මුහුදු පතුලේ කිමිදුණෙමි.
(iv) වන පෙතක අසිරිය.
(v) මා දුටු ඇසළ පෙරහැර. (ලකුණු 20 යි )

(3) ඔබේ පන්ති කාමරයේ බිත්ති පුවත්පතෙහි පළ කිරීම සඳහා ''වස විස නැති දේශීය ආහාර පරිභෝජනයේ වැදගත්කම'' යන මාතෘකාව යටතේ පාසල් ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

**නැතහොත්**

ඔබ ප්‍රදේශයේ මහජන පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සුදුසු ආකෘති පත්‍රයක් පිළියෙල කර සම්පූර්ණ කරන්න. (ලකුණු 10 යි )

(4) පහත සඳහන් ප්‍රකාශ ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න.

(i) ''මොහුගේ නම් භයංකාර විලාසයක් නොමැත්තේ ය හිමිතුමනි, ඔහුගේ තේජස් පෙනුමෙන් ඔහු රජෙකු විය යුතුයයි සිතමි.''
(ii) ''අනික පොත්පත්වල තියෙන හැම දෙයක්ම ඇත්ත විය නොහැකියි''
(iii) ''එහෙනම් ඒක ගන්න හැදුවේ ? පලයන් යන්න''
(iv) ''අම්මා මන් එක්ක යන්න එනවා ය කියල පොරොන්දු වුණා.''
(v) ''සීයේ එතකොට අවුරුද්දට කරන සෙල්ලම්?'' (ලකුණු 2 x 5 = 10 යි)

| | පාඩමේ නම | කා විසින් කියන ලද්දක් ද? | කා හට කියන ලද්දක් ද? | කුමන අවස්ථාවකදී කියන ලද්දක්ද? |
|---|---|---|---|---|
| (i) | | | | |
| (ii) | | | | |
| (iii) | | | | |
| (iv) | | | | |
| (v) | | | | |

(5) (i) නාම පදවල ස්වරූපය අනුව නාම පද, සාමාන්‍ය නාම පද බව අපි දනිමු. ඒවා වර්ග කීපයකින් හඳුනාගත හැකිය. එම වර්ග නම් කරන්න. (ලකුණු 5 යි )

(ii) එම වර්ගවල නාම පද සහිත වාක්‍යය බැගින් ලියා නාම පදය යටින් ඉරක් අඳින්න. (ලකුණු 5 යි )
(මුළු ලකුණු 10 යි )

(6) පහත සඳහන් වාක්‍ය සුදුසු අතීත කාල අඛ්‍යාත පද යොදමින් සම්පූර්ණ කරන්න.

(i) ශිෂ්‍යාව ගීයක් ......................................................
(ii) ශිෂ්‍යාවෝ ගී ......................................................
(iii) මිනිසා ගසක් ......................................................
(iv) මිනිස්සු ගස් ......................................................
(v) කම්කරුවා උදෙන් ම වැඩට ................................................................
(vi) දක්ෂයෝ තරගය ජයග්‍රහණය ...............................................................
(vii) සොරු පොලීසියට ..................................................................................
(viii) පොලිස් නිළධාරීහු වාහන නතර .........................................................
(ix) කුරුල්ලෝ ඉහළ අහසේ ..........................................................................
(x) ඉබ්බා සෙමින් සෙමින් වනයට .......................................................... (ලකුණු 10 යි )

(7) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

'තෙලිකඩ හාමුදුරුවෝ' යන නමින් ප්‍රසිද්ධ ධර්මධර විනයධර මහා ස්ථවිරයන් වහන්සේ වෙතින් පැවිදි බව ලබා ගත් ගුණානන්ද තරුණ ස්ථවිරයන් වහන්සේ පැවිදි වූ දිනයේ තුන් යම් රාත්‍රිය මුළුල්ලෙහි අගනා ධර්ම දේශනාවක් පැවැත්වූහ. ධර්ම ශ්‍රවණය සඳහා පැමිණි දහස් ගණන් බෞද්ධ ජනතාව ඉමහත් ප්‍රසාදයට පත්වූහ. ගුණානන්ද ස්වාමීන් වහන්සේ පිළිබඳ අනාගත බලාපොරොත්තු ඇති කර ගත් ඔවුහු උන් වහන්සේගේ කැපකරු දායකයන් බවට පැමිණියහ.

(i) මෙම ඡේදයෙන් කියවෙන්නේ කවුරුන් පිළිබඳව ද?

(ii) උන් වහන්සේ පැවිදි බව ලබා ගත්තේ කාගෙන් ද?

(iii) උන් වහන්සේ පැවිදි වූ දින රාත්‍රියේ කළේ කුමක් ද?

(iv) ධර්මය ශ්‍රවණය සඳහා පැමිණි දහස් ගණන් බෞද්ධ ජනතාව ඉමහත් ප්‍රසාදයට පත්ව කටයුතු කළ අයුරු ඡේදයේ සඳහන් වන්නේ කෙසේ ද?

(v) පහත සඳහන් පද සඳහා විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(i) ප්‍රසාදය
(ii) පැමිණි

(ලකුණු 2 x 5 = 10යි)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 8 - 2017

### සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු පත්‍රය

## I කොටස

(1) - (ii) (2) - (iii) (3) - (iv) (4) - (ii) (5) - (i) (6) - මිදෙම්වා (7) - යන්නෙහි
(8) - (ii) (9) - (i) (10) - පැලට (11) - වනයට (12) - (iii) (13) - (iv) (14) - (i) (15) - (i) වංගෙඩිය

(16) - (i) අඹර, අවකාශය, ආකාශය, පවන්මග, සුරමග, යනාදි
(ii) අක්ෂිය, ඇස, නයන, නෙත, නේත්‍රය

(15) - (ii) කබල්ලෑව

(17) - (i) ප්‍රතිලෝම (ii) අධම (iii) ආධුනික (iv) නිකළැල්

(18) - (i) දන්ත, දෑඩි, ජඨාව, ආසන්න
(ii) තොරතුරු, රංචු, වර්ග, ව්‍යසු

(19) - (i) සමකාලීන
(ii) ප්‍රතිචක්‍රීකරණය

(20) - බිත්තර ගෙඩිය

(ලකුණු 2 x 20 = 40 යි)

## II කොටස

(1) (i) ගුණදාස අමරසේකර මහතා
(ii) මහගම සේකර මහතා
(iii) ශබ්ද නගා කියවීම.
නිශ්ශබ්දව කියවීම.
(iv) හතළිස් අට
භාර්යාව, බිරිඳ, අඹුව යනාදි
(v) කකා ගිය ලෙල්ල රස කර — උයාලූ
අද බැරි නම් හෙට තෝරාපන් — යාළු

(2) සුදුසු පරිදි ලකුණු දෙන්න.

(3) ආකෘතිය, අන්තර්ගතය, ශිල්පීය දක්ෂතා අනුව ලකුණු ලබා දෙන්න.

(4)

| | පාඩමේ නම | කා විසින් කියන ලද්දක් ද? | කා හට කියන ලද්දක් ද? | කුමන අවස්ථාවකදී කියන ලද්දක්ද? |
|---|---|---|---|---|
| (i) | නිවැරදිව කියවමු | මනමේ කුමරිය | මනමේ කුමාරයාට | වැදි රජු දුටු අවස්ථාවේ |
| (ii) | සැබෑ ළෙන්ගතුකම | යුව රජු ඇතුළු රාජ සභාව | අධිරාජ්‍යයාට | අධිරාජ්‍යයා පොත්වල සඳහන් සිංදු කියන කිරිල්ලිය ගැන විමසූ අවස්ථාවේ |
| (iii) | අවුරුදු සිහිනය | කඩයේ මුදලාලි<br>රතිඤ්ඤා මුදලාලි | පියසේනට / ළමයාට | කඩය ඉදිරියේ බිම තිබූ රතිඤ්ඤා පෙට්ටි අල්ලා බැලීමට සූදානම් වූ අවස්ථාවේ. |
| (iv) | අවුරුදු සිහිනය | පියසේන | තමාටම | පියසේන අම්මා එනතුරු පාර දෙස බලා සිටින අවස්ථාවේ |
| (v) | අලුත් අවුරුදු උත්සවය | පුතා/මුණුබුරා | සීයාට | සීයා අවුරුදු සිරිත් විරිත් ගැන කතා කරන අවස්ථාව |

(5) (i) ජාති නාම, ද්‍රව්‍ය නාම, ගුණ නාම, ක්‍රියා නාම, සංඥා නාම
(ii) උක්තාඛ්‍යාත අනුව නිවැරදි වාක්‍යවලට ලකුණු ලබා දෙන්න.

(6) සුදුසු අතීත කාල ආඛ්‍යාත පද අනුව ලකුණු ලබා දෙන්න.

(7) (i) ගුණානන්ද තරුණ ස්ථවිරයන් වහන්සේ ගැන
(ii) තෙලිකඩ හාමුදුරුවන්ගෙන්
(iii) අගනා ධර්ම දේශනයක් පැවැත්වීම.
(iv) උන් වහන්සේගේ කැපකරු දායකයන් බවට පත්වීම
(v) (i) අප්‍රසාදය
(ii) නොපැමිණි